


**ශ්‍රී. බු. ව. 2560 ක්වූ ඉල් මස කලාපය, රා. ව. 2016 ක් වූ නොවැම්බර් මස 14 වන දින**

**මාතර, ශ්‍රී සුදර්ශී විද්‍යායතන නියෝජ්‍ය පරිවෙණාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති**

**ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

# මහත් ඵල ලැබෙන දන පහක් හඳුනා ගනිමු.

**( අඞ්ගුත්තර නිකාය - පඤ්චක නිපාත කාලදාන සූත්‍රය )**

**ගරු ස්වාමින් වහන්ස, කාරුණික පින්වත්නි,**

**පඤ්චිමානි භිකඛවෙ කාලදානානි. කතමානි, පඤ්ච ? ආගනතුකසස දානං දෙති. ගමිකසස දානං දෙති. ගිලානසස දානං දෙති. දුබභිකෙඛ දානං දෙති. යානි නව සසසානි නව ඵලානි, තනි පඨමං සීලවනෙතසු පතිටඨාපෙති.**

**"මහණෙනි කාලදානයෝ පස් දෙනෙක් වෙති. කවර පස්දෙනෙක්ද? ආගන්තුකයාට දානය දෙයි ගමනක් යන කෙනෙකුට දන් දෙයි. ගිලනාට දන් දෙයි. දුර්භික්ෂයෙහි දන්දෙයි. නව සශ්‍ය නව ඵල කෙනෙක් වෙත් නම් එහි පළමු කොටස සිල්වතුන්ට දෙයි."**

**අද ඉල් පුර පසළොස්වක පොහොය දිනයයි. බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතන නම් වූ මිගදායේදී පළවන ධර්ම දේශනාව පවත්වා මුල්ම රහතන් වහන්සේලා හැට නම අමතා දේශනා කළේ "චරථ භිකඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය, ලොකානුකමපාය අතථාය හිතාය සුඛාය දෙවමනුසසානං" යනුවෙන් "මහණෙනි බොහෝ දෙනාට හිත පිණිස, සැප පිණිස, ලෝකයාට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ට හිත සුව පිණිස, දහම් චාරිකාවේ හැසිරෙන්න". යනුවෙන් අවවාද කොට තම ශිෂ්‍ය පුත්‍රයින් වහන්සේලා පිටත්කර හැරියේ අද වැනි ඉල්පුර පසළොස්වක පොහොය දිනයකය. තුන්**

භික්ෂූන්වහන්සේලා මහා පවාරණයෙන් වස් පවාරණය කළ පසු කඨින පිංකම් ආරම්භවෙයි. එම කඨින පිංකම් අවසන් වන්නේද මෙම ඉල් පුර පසළොස්වක පොහොය දිනයෙනි. මෙවැනි උතුම් පුරපසළොස්වක පොහොය දිනයක මෙම සදහම් පණිවිඩයෙන් අපේක්ෂා කරන්නේ මහත්ඵල මහානිසංශ දාන පහක් පිළිබඳ විස්තර කර දීමටයි.

අඞ්ගුත්තර නිකායේ කාලදාන සූත්‍රයේ සඳහන්වන මුල්ම දානය ආගන්තුකයාට දෙන දානයයි. ත්‍රිපිටකයේ සඳහන් බොහෝ සූත්‍රවල තථාගතයන් වහන්සේ හමුවීමට එන භික්ෂූන්, බමුණන්, ගෘහපතියන්, සමග කරන ලද සාකච්ඡා වලින් පැහැදිළි වන්නේ එම ආගන්තුක සත්කාරයයි.

''සතුටුවිය යුතු සිහි කටයුතු කථාවෙන් කල් ගෙවීය'' යනුවෙන් සඳහන් කරන්නේ එම ආගන්තුක දානයයි. ''සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරිමහ'' යනුවෙන් සූත්‍රවල ඒ බව සඳහන්වේ. එම බුදුරජාණන් වහන්සේ සරණ ගිය ගිහි පැවිදි හැමදෙනාමත් එම ආගන්තුක දානය දිය යුතුයි. පැරණි විහාරස්ථානවල ආවාසගෙය සකස්කරන විට ආගන්තුකයින් සඳහා කාමරයක් වෙන් කරයි. පන්සලට එන ආගන්තුකයාගේ නියම සවභාවය තේරුම්ගෙන මෙම ආගන්තුක සත්කාරය කළ යුතුයි. සමහරු ආගන්තුකයින් ලෙස පැමිණ පන්සලේ හෝ ගෙදර තිබෙන සියලු දේ සොරකම්කරගෙන යනු අප අසා ඇත. එවැනි අයගෙන් ප්‍රවේශම් වීමට වගබලා ගතයුතුයි. නැතිනම් ආගන්තුක සත්කාරය නිසා අපි අසහනයට පත්වෙමු.

අපේ පැරණි සිංහලයින් බුදුදහමෙන් ලැබුණු මෙම ආභාසය නිසා ආගන්තුක දානය ඉතා ඉහළින් සිදුකර තිබේ. දෙවන ලෝක සංග්‍රාමයේදී ජපන්නු ලංකාවට බෝම්බ දමා විනාශ කළ පසු කොළඹ ජීවත්වූ අය පිටිසරබද ප්‍රදේශවලට ගොස් තම නෑදෑතිගෙවල්වල ජීවත් විය. පාදුක්ක පළාතේ පිටිසර ගම්මානයක පතිරගේ දොන් පීරිස් අප්පුහාමි නමින් දක්ෂ ගොවියෙක් ජීවත් විය. එතුමා දක්ෂ වඩුකාර්මිකයෙක් ලෙසද ප්‍රසිද්ධව සිටියේය. කොළඹ පලාතෙන් පැමිණි ආගන්තුක නෑදෑයින්ට තම ගෙදරදී එතුමා තම බිරිඳ සහ දරුවන් සමග අසළ තිබූ වඩුමඩුව පොල්අතු වලින් අහුරාගෙන එතන පදිංචියට ගියහ. 1942 මැයි මස 29 වෙනිදා පීරිස් අප්පුහාමිගේ බිරිඳ සිය දෙවන දරුවා මෙලොවට බිහිකළාය. ඒ පුතාගේ නම රත්නසේකරය. ශ්‍රී ලංකාවේ ජාතික ආගමික කටයුතු වලදී අප්‍රමාණ කැපවීම් කොට අපවත්වී වදාළ අතිපූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමි ඒ උතුම් බුද්ධපුත්‍රයාණෝය. ගර්භනී අවස්ථාවේ සිටි තම ස්වාමි දියණිය පහසුකම් නැති වඩුමඩුවට රැගෙන යාමෙන් පෙනෙන්නේ අපේ පැරණි අය ආගන්තුක දානය දුන් හැටිය.

නමුත් වර්තමාන ශ්‍රී ලංකාවේ මේ ආගන්තුක දානය පිරිහී තිබෙන බව පෙනේ. පන්සලකට හෝ ගෙදරකට ආගන්තුකයෙකු පැමිණියොත් ඒ ආගන්තුකයා මහත් කරදරයක් හැටියට සළකන අය අද අපේ රටේ සිටිති. එසේ නොමැතිව එම ආගන්තුකයා හොඳින් පිළිගෙන ඔහුට සංග්‍රහ කරන අයද සිටීම සතුටට කරුණකි.

අපේ රටේ අධ්‍යාපන ආයතනවල ඉහළම තැන ලැබෙන්නේ විශ්ව විද්‍යාල වලටයි. එම විශ්ව විද්‍යාල වලටත් වසරකට වරක් ආගන්තුක පිරිසක් පැමිණෙති. එම සිසුන් පැමිණෙන දිනයට විශ්ව

විද්‍යාල ඉදිරියේ "නවක ඔබ සාදරයෙන් පිළිගනිමු" යනුවෙන් ප්‍රදර්ශනය වේ. නමුත් පිළිගන්නා හැටි පුවත් පත් වලින් දැකගත හැකිය. මෙසේ කටයුතු කරන්නේ ආගන්තක දානය හරියට හඳුනා නොගත් අයය. එවැනි අය දෙන මේ නවක වධය කුමකටද? පැරණි රජදවස දෙතිස්වධයක් දුන්බව කියවේ. මෙය තිස්තුන්වන වධය හැටියට සැළකීමට පුළුවන. ශ්‍රී ලංකාවේ ගිහි පැවිදි කී දෙනෙක් මේ නිසා විශ්වවිද්‍යාල ජීවිතයෙන් සමුගෙන තිබේද? කී දෙනෙක් සදකාලිකව රෝගීන් වී සිටිත්ද කී දෙනෙක් වටිනා මිනිස් ජීවිතයෙන් සමුගෙන ඇත්ද? මේවා කරන අය කියන්නේ ආගන්තුක සිසුන්ගේ ඔලුව නැතිකර කව්රුත් එක මට්ටමට ගැනීමට මේ කටයුතු කරන බවයි. දුප්පත් දෙමාපියන්ගේ දරුවන් වන අපට ඔය කියන විදියේ ඔළු නැත. ධනවත් දරුවෙක් තමාට අයිති වාහනයෙන් විශ්ව විද්‍යාලයට පැමිණීම වරදක්ද? එම වාහනයේ ටයර්වල හුලං ඇර දැමීම සුදුසුද? මේවා ගැන සිතා බැලිය යුතු කාලය උදා වී තිබේ. බෞද්ධ සංස්කෘතිය තුළ සුරාව පිළිකුල් කරන දෙයකි. සමහරවිට පිණිබිඳක් පමණවත් සුරාව තොළ නොගැටුන දරුවන් සුරාවට හුරුවන්නේ මෙම නවකවධයේ නරක ප්‍රතිඵලයක් ලෙසටයි. ඒ නිසා බෞදධයන් වන අප සියලුම දෙනා ආගන්තුක දානයෙහි වටිනාකම තේරුම්කරගෙන ක්‍රියා කිරීමට උත්සාහවත් විය යුතුයි.

මෙහි සඳහන් වන දෙවන දානය ගමනක් යන කෙනෙකුට දෙන දානයයි. පැරණි සමාජයේ බොහෝ දෙනා ගමන් කළේ පයින්ය. ඒ නිසා පාර දෙපස සෙවන ඇති ගස් වැවූහ. අතමරඟ අම්බලන් සකස්කර තිබුණි. පාරේ දෙපස පැන්තාලි තබා විඩාව සන්සිඳුවා ගැනීමට කටයුතු කළහ. නූතනයේ නම් බොහෝ විට වාහනවලින් ගමන් කරනා බැවින් ඉහත කී දේ දැකගත නොහැක. නමුත් අප තේරුම් ගත යුත්තේ ගමනක් යන කෙනෙකුට එසේ උදව් කිරීම පරිසරයට කරන හිතවත් කමක් ලෙසටයි. එසේ උදව් කිරීම පරිසරයට කරන හිතවත් කමක් ලෙසටයි. එසේ කළ හැක්කේ සත්පුරුෂ සිතුවිලි ඇති අයට පමණි. ගමනක් යන කෙනෙකු අතරමං වී සිටී නම් ඔහුට උදව් කළ යුතුයි. වාහනයකට කරදරයක් වී තිබේ නම් සොයා බලා ඊට අවශ්‍ය උදව් ලබා දිය යුතුයි. එසේ කටයුතු කරන සත්පුරුෂයා මහා පිනක් රැස්කර ගනී. සමහරු එවැනි කෙනෙකු දුටුවිට මහත් කරදරයක් ලෙස සිතති. එසේ කරන අසත්පුරුෂයින් පව් රැස්කර ගනී. මෙම කාලදාන සූත්‍රය කියන්නේ ගමන් බිමන් යන කෙනෙකුට දෙන දානය මහත්ඵල ලැබෙන බවයි.

ආනිශංස ලැබෙන තුන්වන දානය ගිලනුන්ට දෙන දානයයි. අපේ බුදුරජානන්වහන්සේ පූතිගත්තතිස්ස හිමියන්ට කළ සත්කාරය එවැනි උතුම් පිංකමකි. එය සිදුකොට ලෝකයාට දුන් අවවාදය වූයේ ගිලානෝපසථානය බුධෝපසථානයක් බවයි. නූතනයේ මේ උතුම් පිංකම මිළ මුදලට යටවී ඇත. අද සමාජයේ උපස්ථායක සේවාව යනු බොහෝවිට මුදල් උපයන රැකියාවක් බවට පත්වී තිබේ. ජීවත්වීම සඳහා සාධාරණ මුදලක් ගැනීම වරදක් කොට නොසළකමි. නමුත් අද සමහර උපස්ථායකයෝ රෝගීන් කීප දෙනෙකු බලා ගැනීමට බොහෝ දෙනෙකුගෙන් මුදල් ලබා ගනිති. නමුත් ඒ සේවය ඔවුන්ගෙන් හරියට ඉටුවන්නේ නැත. නමුත් සමහර උපස්ථායකයින් කරුණාවෙන් රෝගීන්ට උපස්ථාන කරනු අප දැක ඇත. ගිලනෙකුට ආහාර වර්ග දෙකක් අවශ්‍යය කයට දෙන ආහාර වලදී නරක ආහාරවලින් මුදවා ගැනීම අවශ්‍යය, හිතට ද නරක ආහාර නොදිය යුතුයි. නිතරම රෝගියා සතුටින් තැබීමට උත්සුක විය යුතුයි. මෙසේ සිදුකරන ගිලානෝපස්ථානය ඉතා උතුම් පිංකමකි.

මෙම සූත්‍රය උගන්වන ආනිශංස දායක හතරවන දානය දුර්භික්ෂ කාලයෙහි දෙන දානයයි. කෑම් බීම් ආදී භෞතික සම්පත් අඩුකාලය දුර්භික්ෂ කාලයයි. අපේ රටේද ඉතිහාසය තුළ එවැනි අවස්ථා තිබුණි. එවැනි කාලයේදී දානයක් දීමට අවස්ථාවක් යෙදේ නම් එය ඉටුකරදීම මහත්ඵල මහානිශංස දානයකි. දුර්භික්ෂකාලයේදී දානයක් දීම යනු කරුණාව පෙරදැරිකරගෙන සිදුවන්නකි. අනුන්ට දුකක්

ඇතිවූ විට ඔවුන්ට පිහිට වීම යනු සත්පුරුෂයින්ගේ ක්‍රියාවකි. පසුගිය "සුනාමි" විපතේදී බොහෝ දෙනෙක් දුර්භික්ෂ භයකට පත්වූ හැටි අපට මතකය. එහිදී අපේ ගිහි පැවිදි බොහෝ දෙනෙක් ඉතා කරුණාවෙන් ක්‍රියා කළ හැටිද කාටත් මතකය. එවැනි අවස්ථාවල දෙන දානය විශේෂ ආනිශංස දෙන බව සිත තබාගත යුතුයි. ඒ තත්ත්වය අවබෝධකර නොගත් සමහරු විපතට පත් වූ අයගේ වස්තුව සොරෙන් ගත් හැටිද අපට මතකය. එවැනිදේ කළේ නාමික බෞද්ධයෝය. එවැනි අය එකතුකර ගත්තේ නරක කර්ම නැමති කදතීහුය. ඒ නිසා රටේ කොතැනකට දුර්භික්ෂයක් ඇති උනත් එය අපට සිදුවූ විපතක් සේ සිතා ක්‍රියාකිරීමට වගබලාගත යුතුයි. බුදුපියාණන් වහන්සේ එද විසාලා මහනුවරට වැඩමවා රතන සූත්‍ර දේශනාව සිදුකළේ ඒ සඳහායි. ඒ නිසා දුර්භික්ෂය පහවී රටම සුවපත් වූ බව කියයි.

කාල දාන සූත්‍රය හඳුන්වා දෙන පස්වන දානය නව සශ්‍ය දානයයි. කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය ලෙස හැටියට ක්‍රියා කරන බෞද්ධයා ඒ ගොවිතැන් කටයුතු සියල්ල ආරම්භ කරන්නේ තුණුරුවන් සිහිපත් කරගෙනයි. තමාගේ පරිභෝජනය සඳහා සූදානම් කරගන්නා එම භෝග ජාතීන්ගේ මුල් කොටස බුදුරජාණන්වහන්සේට පූජා කිරීම පැරණි අයගේ සිරිතකි. ගොවිතැන් කරන අය සියළුම දෙනා වී අස්වැන්නෙහි පළමු කොටස කුඹුරේදීම පිනට වෙන්කරති. ඒවා හඳුන්වන්නේ පින් වී හැටියටයි. සමහර පළාත්වල කුඹුරුයායේම අය එකතු වී නව සශ්‍ය දානය යනුවෙන් දානයක් දෙති. බොහෝ තැන්වල ඉඹුල් කිරිබත් උයා එම දානය පිරිනමනු ලැබේ. ඒ තුළින් තමාගේ ගොවිතැන් කටයුතු සාර්ථක වන බවත් වැඩි ආනිශංසයක් ලැබෙන බවත් අපේ විශ්වාසයයි. එම පින් දෙවියන්ට අනුමෝදන් කොට දෙවියන්ගේ ආශිර්වාදයද උදාකර ගැනීමට අපි පුරුදු වී සිටිමු. මෙම නවසශ්‍ය දානය තුළින් මුළු කුඹුරුයායේම ගොවියන්ගේ සමගිය වැඩි දියුණු වෙයි. ඒ නිසා සියලු දෙනාම එකට එකතු වී ගොවිතැන් කළහ. නමුත් අපේ රටේ බොහෝ තැන්වල මේ තත්ත්වය නැත. ඒ අය නවසශ්‍ය දානයක් ගැන දන්නේද නැත. කුඹුරුයායේ ගොවියන් අතර කිසිදු සමගියක් ද නැත. කෙනෙක් අනෙකාට නොදැනෙන සේ කුඹුර සකස් කොට වී වපුරයි. එම කොට සේ ගොයම පී දෙන විට යාය තුළ අනෙක් කුඹුරුවල වැඩ පටන්ගෙනවත් නැත. ඒ නිසා යායටම එන මැස්සන් අර තනි කුඹුරට අවුත් කුඹුර විනාශ කරනු පෙනේ. මෙවැනි දුර්විපාක වලට මුහුණ දීමට සිදු වී ඇත්තේ අප ඉහත සඳහන් කළ නව සශ්‍ය දානයෙන් හික්මීමක් ලබා නැති නිසාය.

අධ්‍යාපනය ලබන දරුවන්ද සිදුකරන්නේ තම මනස තුළ කිසියම් භෝගයක් වගාකිරීමයි. එසේ ඉගෙනුම ලබන දරුවන් තමාට ලැබෙන මුල් වැටුපෙන් එවැනි පිංකම් කරනු අප දැක ඇත. එයද නව සශ්‍ය දානය ලෙස දැක්විය හැකිය. බොහෝ බෞද්ධයින් තමාගේ ගෙදර ගසක මුලින්ම පළතුරක් ඇති උනත් බුදුරජාණන්වහන්සේට පූජා කරනු පෙනේ. ඒ නිසා අපි සියලුම දෙනා එම නව සශ්‍ය දානයටද හුරුවී වැඩිපුර කුසල් කර ගැනීමට උත්සාහවත් විය යුතුයි.

මේ සඳහන් කළ සුදුසු කල්හි දෙන දානය හොඳින් හඳුනාගෙන ක්‍රියාකරමින් අපේ දිග සසර කෙටි කරගෙන නිවන් සැපත උදාකර ගැනීමට උත්සාහවත් වෙමු.